

# අස්ගිරි ඇනවුම හා සඟසසුන

**මහාචාර්ය කපිල අභයවංස**



සඟ සසුනට නිගා වන අයුරින් අපහාසාත්මකව භික්ෂූන් ඇමතීම හෙළා දැකිය යුතු බව අස්ගිරි පාර්ශ්වයේ සංඝසභා නිවේදනයෙන් කියවෙයි. ගෞරවාන්විත පදවලින් තොරව භික්ෂූන් නමින් ඇමතීම නොකළ යුත්තක් හා වහා නතර කළ යුත්තක් බව ද විශෙෂයෙන් සඳහන් කොට තිබිණ. මෙබඳු අදහස් අන්තර්ගත වූ අස්ගිරි නිවේදනය බුදුසසුනට ලැදි කාගේත් අවධානයට යොමු විය යුත්තකි. බුදුන්වහන්සේට ධර්මයට හෝ සංඝයාට අපහාසාත්මකව භික්ෂුවක් හැසිරේ නම් එය එම භික්ෂුවට උක්බෙපනීය නම් වූ දඬුවම දී රූහෙන් පලවා හැරීම ශාසනික පිළිවෙතයි. ගිහියකු එසේ හැසිරේ නම් ඔහුට පත්තනික්කුජ්ජන දඬුවම දී ඔහුව ප්‍රතික්ෂේප කිරීම ශාසනික පිළිවෙතයි. එහෙත් මේවා අතීත ශාසනික පිළිවෙත් මිස වර්තමාන සඟ සසුන තුළ ක්‍රියාත්මක වන ඒවා නොවේ.

භික්ෂුත්වයෙන් මුලූමනින් ම පන්නා දැමිය යුතු එක පාරාජිකයකට නොව සතර පාරාජිකයන්ට ම පැමිණියත් සිවුරේම රැඳී සිටින තත්ත්වයන් යටතේ සඟ සසුනේ වර්තමානය බෙහෙවින් ම ශාසනවිරෝධී වෙයි. ඇතැම්විට සංඝ සභා එබන්දන්ගෙන් සංයුක්ත වන්නේ නම් මුලූ සංඝ සභාවේම කටයුතු විනය විරෝධීවන බවත් ඒ කටයුතුවලට සහභාගී වන භික්ෂු පිරිසම නින්දා කළයුතු බවට පත්වන බවත් එසේ කෙරෙන සංඝ කර්මයන් බල රහිත බවත් බුද්ධනියමයයි.

ගිහියන් භික්ෂූන් කෙරෙහි දක්වන ආකල්පය සකස් වීමට පාදක වන්නේ භික්ෂූන්ගේ හැසිරීම් රටාවයි. භික්ෂූන් ගිහියන් ලෙස හෝ ගිහියන්ටත් අන්ත ලෙස හැසිරෙත් නම් ගිහියන් ඔවුන් කෙරෙහි දක්වන්නේ අපහාසාත්මක ආකල්පයකි. භික්ෂුව ගිහියන්ගෙන් වෙන් ව වෙනස් ව ක්‍රියා කරන්නෙකි. භික්ෂුවට ගිහියන්ගෙන් වෙනස් වූ හැසිරීම් රටාවක් නියමිතය. ඒ රටාවෙන් ඉවත් වූ විට ගිහියාත් භික්ෂුවත් අතර වෙනසක් නැතිවෙයි. එසේ වන විට ගිහියා භික්ෂුව දකින්නේ අපහාසාත්මකවය. නින්දා කටයුත්තකු ලෙසය. මේ තත්ත්වය නැති කරගනු සඳහා ක්‍රියා කළයුත්තේ භික්ෂුව විසින්මය. එය සංඝ නිවේදන වලින් වළක්වාලිය හැක්කක් නොවේ. සංඝසභාවල කාර්යය විය යුත්තේ භික්ෂුව භික්ෂුත්වයට උරුම හැසිරීමෙහි හා ප්‍රතිපදාවෙහි පිහිටුවාලීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමයි.

භික්ෂුව විසින් සැබෑ භික්ෂුවකට උරුම ගෞරවය ගිහියන්ගෙන් ලබා ගැනීම තුළ ශාසනයේ පැවැත්ම රැඳී තිබේ. බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට විනය පැනවී ඇත්තේ භික්ෂූන් ප්‍රකෘති භික්ෂුත්වයෙහි රඳවා තබා ගැනීම සඳහාය. නිර්වාණය එහි ආනුසංගික ප්‍රතිඵලයක් මිස ඍජු ප්‍රතිඵලයක් නොවේ. විනයානුකූල වීම තුළ භික්ෂුව ගරු කළයුත්තකු බවට පත්වෙයි. එවිට සසුන ගිහියන් අතර ප්‍රසාදයට පත් වෙයි. එය සසුනේ දිගු කල් පැවැත්මට හේතුව වෙයි. විනයො නාම සාසනස්ස ආයු යනුවෙන් අතීතයෙහි විසූ භික්ෂූන් විසින් පවසා ඇත්තේ මේ නිසාය.

භික්ෂූන්ගේ හැසිරීම් රටාව භික්ෂුත්වයට උරුම වූවක් නොවේ නම් සසුන ආරක්ෂා කළ නොහැකිය. භික්ෂු රටාවෙන් ඉවත්ව සිවුර පමණක් භික්ෂුත්වයේ උරුමය කර ගනිද්දී සසුන ලෙස ඉතිරි වන්නේ බහිරවයන් විසින් රැක ගන්නා නිධාන වැනි වූ සිවුරු දරාගත් ගිහියන් විසින් රකින වෙහෙර විහාර රැසක් පමණි. මෙය බුදු සසුන පිහිටුවා ලූ බුදුන්වහන්සේගේ අභිලාෂය නොවේ. එබැවින් ගිහියන්ගේ ගෞරවයට පාත්‍ර විය හැකි භික්ෂු ආකල්ප හා හැසිරීම් භික්ෂූන්ට අවධාරණය කිරීමට බුදුන් වහන්සේ නිතරම ක්‍රියා කොට තිබේ. භික්ෂූන් විසින් සෑම මොහොතකම සිහිපත් කළ යුත්තක් ලෙස අවධාරණය කොට ඇත්තේ භික්ෂුව තමා ගිහියාගෙන් වෙනස් වූ ආකල්ප සම්පත්තියකින් එනම් හැසිරීම් රටාවකින් යුක්තව විසිය යුතු බවයි. අඤ්ඤෙදා මෙ ආකප්පො කරÞයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං යනුවෙන් දැක්වී ඇත්තේ එයයි.

භික්ෂූන් අරහයා ගිහියන්ගෙන් නිසි තැන නැගෙන අවලාද අපහාස හා නින්දා ශාසනයේ විනාශයට හේතුවක් ලෙස සංඝ සභාවකින් දකින්නේ නම් එය සංඝ සභාවට වැරදී ගිය තැනකි. ගිහියෝ සැබෑ භික්ෂුවට කිසිවිට නොගරහති. සැබැවින් ම ගිහියන් භික්ෂූන් විවේචනය කරන්නේ ගරහන්නේ ඔවුන් භික්ෂුචර්යාවෙන් බැහැර වූ විටය. එබඳු විවෙචන හා ගැරහීම් ශාසනයේ යහපතට හා මනා පැවැත්මට සාධක වූ වග ශාසන වාර්තා වලින් ම සනාථ වෙයි.

භික්ෂු සාරූප්‍ය නොවන හැසිරීම්වලට ගිහියන් එරෙහි නූනා නම් භික්ෂු ශාසනයක් අද අපට නොදකින්නට ඉඩ තිබිණ. බුදුන් පැනවූ විනය නීතිමාලාවේ බහුතරයක් නීති පැනවුනේ භික්ෂූන්ට එරහිව ගිහියන් නැගූ විරෝධතා හඬ නිසා බවට විනය පිටකයෙන් ලැබෙන සාක්ෂ්‍ය රාශියකි. පාරාජික පාලිය හා පාචිත්තිය පාලිය පුරා පැතිරී ඇති විනය නීති පැනවීමේ නිදාන කථා වස්තුවල අසාරූප්‍ය භික්ෂු හැසිරීම් වලට එරෙහිව ගිහියන් නැගූ විරෝධතා වාර්තාගත වී ඇත. කාමභෝගී ගිහියන් මෙන් ශ්‍රමණ ශාක්‍යපුත්‍ර භික්ෂූන් හැසිරෙන්නේ කෙසේදැයි අසමින් එවත ගිහියන් විරෝධතා නැගීම් උද්ඝෝෂණය කිරීම් පැවැත්වූ බව එම වාර්තාවන්හි දැක්වෙයි. බුදුන් වහන්සේ එම ගිහී විරෝධතාවන්ට ප්‍රතිචාර දක්වමින් අදාළ නීතිරීති පැනවීම් සිදු කොට තිබේ.

වර්තමාන ලාංකික සඟ සසුන ලෙස පෙනී සිටින භික්ෂූන් වහන්සේලාගේ ශාසන විරෝධී හා විනය විරෝධී ක්‍රියාකාරිත්වයන් ගැන විමසා බලන හෝ සමාලෝචනය කරන කිසිදු ආයතනයක් හෝ සංඝ සභාවක් පවතින බවට කිසිම සාධකයක් නොමැත. එම නිසාම සඟ සසුන දිනෙන් දින අගාධයට ම යන බවක් දක්නට ලැබේ. කවර හෝ අරමුණක් මත මුසපත්ව ශීලාචාර මනුෂ්‍යත්වයට පවා නිගා දෙන අයුරින් කලකෝලාහලවල යෙදෙන සිවුරු ගලවාගෙන එහෙ මෙහෙ දුවන ගිහියන්ට තර්ජනාංගුලය ඔසවන ගල් මුගුරුවලින් දමා ගසන මාරාවෙශ වූ භික්ෂු කණ්ඩායම් ලාංකික ගිහී බෞද්ධයන්ට සුලභ දසුනක් වී තිබේ.

බුදුසසුන රැකීම යන ලේබලය යටතේ කරලියට එන භික්ෂු කණ්ඩායම් බොහෝය. පුදුමය නම් ඒ ඒ කණ්ඩායම් සඳහා හුරේ දැමීමට සැදී පැහැදී ඇති ගිහී ප්‍රේක්ෂක පිරිස් ද පැවතීමයි. බුදුසසුන රැක ගැනීම එකම අරමුණ බව හුවා දක්වන බැවින් එම කණ්ඩායම් හැඳින්වෙන්නේ ද ඊටම උචිත නම්වලිනි. බලය බලසේනා බලකාය වැනි නම් ඒවාට ඈඳා නොගතහොත් ජනතා ආකර්ෂණයක් නොලැබෙයි. මොවුන් රඟන්නේ දුම්මල වරමිනි. ඇතැම්විට මහ සොහොන් දිෂ්ටිය හෝ රාවන අවතාරය ඔවුන්ගේ හිස්වලට ආරූඪ වෙයි. එසේ වූ විට ඔවුන් ක්‍රියා කරන්නේ බුදුන් දැක ආවෙෂ වූ ආලවකයා ලෙසිනි. එසේ නැතහොත් බුදුන් ඉදිරියෙහි වහසි බස් බිණූ වසවත්ති මාරයා පරිද්දෙනි. බුදුන් හමුවෙහි මේ හැම එකෙක්ම දමනය වුවත් සිවුරේ බලය ඉක්මවා යන්නට කිසිවකු ඉදිරිපත් නොවන බැවින් අපේ මේ භික්ෂු කණ්ඩායම් යහතින් වීර චරිත රංගනයෙහි යෙදෙති..

බොදු ජනතාව සිවුර කෙරෙහි දක්වන්නේ අසීමිත භක්තියකි. ගෞරවයකි. ඒ අනන්ත ගුණයෙන් අනූන බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා සිවුර දරා සිටි බැවිනි. මේ නිසා සිවුර දරා සිටින හැම කෙනෙකුම ගරු කළ යුත්තෙකැයි සිතන තරමට බොදු ජනතාව පෙළඹී සිටියි. කවර තරමේ පවු ගොඩක් තම ජීවිතය කරගෙන සිටින පංචස්කන්ධයක් වුව ද සිවුර දරා සිටින්නේ නම් ඕනෑම පාහර වැඩක් කරමින් යහතින් වැජඹීමේ හැකියාවක් සිවුර නිසා ලැබී තිබේ. සිවුරෙන් ලැබෙන පිටුවහල උපයෝගී කර ගෙන කවර තරමින් සසුන කෙලෙසුව ද සංඝ සභාවලින් ඒවාට විරෝධයක් නොනැගෙයි. ප්‍රතිකර්ම ද නොකෙරෙයි. ඒවාට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගතහොත් බෞද්ධ මහජනතාව කිපී රජය දුෂ්කරතාවට පත් කරතැයි සිතා රජය ද අවශ්‍ය ක්‍රියා මාර්ග නොගනියි. මෙසේ බාධක එල්ල විය යුතු දෙපාර්ශ්වයෙන් ම සිදුවන නිහඬ බව ආශීර්වාදයක් කර ගන්නා යෞක්ත ගණයේ භික්ෂූහු තනිව හෝ සාමූහිකව රිසි සේ තම අරමුණු ඉටු කර ගනිති.

බුදුසසුන රැකෙන්නේ ඒ කෙරෙහි ජනතා ප්‍රසාදය වැඩි වූ තරමටය. භික්ෂූන්ට විනය ශික්ෂා පැනවීමේ අරමුණු අතර ද මේ කරුණ පැහැදිළිව දක්වා ඇත. සන්සුන් ඉඳුරන් ඇතිව කායවාග් සමාචාරයෙන් යුක්ත වන භික්ෂුව ඇසූ දුටුවන්ගේ පැහැදීම ඇති කරවයි. කෙලෙස් කසට ඉවත් නොකළ හික්මීමෙන් තොර යමෙක් සිවුරු දරන්නේ ද හෙතෙම සිවුරට නුසුදුස්සෙකැයි පැවසෙන්නේ ද එබන්දෙකු සසුන රැකීමට තබා තමන් රැක ගැනීමටවත් අපොහොසත් වන බැවිනි. කුඩා සාමණෙර හිමී නමකගේ සන්සුන් දසුනින් බුදුසමය වැළඳ ගත් අශොක රජුගෙන් සසුනට වූ සේවය ගැන සියළු ලාංකික භික්ෂූන් මෙනෙහි කළ යුතුව තිබේ.

අද ලක්දිව බුදුසසුන තුළ සිදු වන්නේ ඊට හාත්පසින් ම වෙනස් දෙයකි. සිවුරවත් නිසි ලෙස හැඳ පෙරව ගැනීමටවත් නොදත් කුඩා සාමණේර හිමිවරුන් ද පෙලපාලිවල රූගෙන ගොස් මහ තෙරවරුන් ඩෙගා නටන හැටි පෙන්වමින් ඔවුන්ගේ ද විළිබිය වනසන සැටි සුලබව දක්නට ලැබේ. මේ තත්වය නවතා දැමීමට මහ තෙරවරුන් වහ වහා ක්‍රියා නොකරන්නේ නම් සසුන ඉතා නුදුරේ ම කාෂාවකණ්ඨකයන්ගේ රජ දහනක් වනු නොවැළැක්විය හැකිය.

සසුන රැකීම භික්ෂූන්ගේ ප්‍රධන වගකීමයි. ඒ සසුන යනු අද බොහෝ දෙනකු සිතා සිටින සසුන නම් නොවේ. පන්සල් වෙහෙර විහාර බුදුපිළිම බෝගස් පන්සල් දේපල ආදිය සසුන ලෙස ගෙන ඇත්තේ ද්විතීයික අර්ථයකිනි. නියම සසුන යනු බුදුන් වහන්සේගේ අනුශාසනයයි. වෙනත් ලෙසකින් පවසන්නේ නම් බෞද්ධයකු විසින් පිළිපැදිය යුතු හැසිරීම් රටාවයි.

ප්‍රමුඛත්වයට පත්විය යුතු සසුන අප්‍රධාන වෙමින් ද්විතීයික සසුන ප්‍රමුඛ වීම කාලයා විසින් කරන ලද පෙරලියකි. දැන් එය යථා තත්වයට පත් කර ගැනීමට සුදුසු කාලයයි. මෙතෙක් සිදු කළ රඟපෑම් නිමා කර සදාචාර මාර්ගය වූ නියම බුදුසසුනට භික්ෂූන් වහන්සේ යළි වැඩමවන්නේ නම් ගිහි ජනතාව ද සසුනෙහි රැකෙෂනු ඇත. ඔවුන්ගේ ගෞරවාදරය ද භික්ෂූන්ට හිමි වනු ඇත. එවිට බුදුසසුන අතුරු ආන්තරාවකින් තොරව මනාව සුරැකෙනු නියතය. එබැවින් සංඝසභාවල ප්‍රමුඛ කාර්යය විය යුත්තේ භික්ෂූන් මහජන ගෞරවයට නිස්සන් බවට පත් කරවීමේ ක්‍රියා මාර්ග ගැනීමයි